# පිළිකාව කලින් සොයා ගැනීම සඳහා පරීක්ෂණ

ඔස්ට්‍රේලියාවේ පිළිකා පරීක්ෂා කිරීමේ වැඩසටහන් තුනක් තිබේ මෙම වැඩසටහන් මගින් බඩවැල්, පියයුරු සහ ගැබ්ගෙල පිළිකා වල මුල් රෝග ලක්ෂණ සොයා ගැනීමට සරල පරීක්ෂණ භාවිතා කරයි. පිළිකාව කලින් සොයා ගැනීම මගින් ප්‍රතිකාර කිරීම පහසු කරන අතර, නොනැසී සිටීමේ  අවස්ථා වැඩි කරයි.

මෙම පරීක්ෂණ පිළිකා රෝග ලක්ෂණ නොමැති පුද්ගලයින් වෙනුවෙන් පවතියි. ඔබට පිළිකා රෝග ලක්ෂණ ඇත්නම්, ඔබේ වෛද්‍යවරයාට පවසන්න.

ඔබට කොළ හෝ නිල් (අතුරු) පැහැති Medicare කාඩ්පතක් තිබේ නම් පරීක්ෂණ තුන නොමිලේ සැපයේ. ඔබට Medicare කාඩ්පතක් නොමැති නම්, පරීක්ෂණ සඳහා කොපමණ මුදලක් වැය වේද යන්න පිළිබඳව ඔබේ වෛද්‍යවරයා සමග කතා කරන්න.

**පිළිකා සඳහා පරීක්ෂා කිරීම ඔස්සේ ඔබේ ජීවිතය ආරක්ෂා කරගත හැකිය.**

ඔබට ආන්ත්‍රික, පියයුරු හෝ ගැබ්ගෙල පිළිකා හඳුනා ගැනීමේ පරීක්ෂාව පිළිබඳ වැඩි විස්තර අවශ්‍ය නම්, පිවිසෙන්න

- cancersa.org.au
- breastscreen.sa.gov.au
- ncsr.gov.au

පිළිකාවක් ඇති බව හඳුනා ගැනීමෙන් පසු ඔබට සහාය අවශ්‍ය නම්, **13 11 20** ඔස්සේ **Cancer Council SA** අමතන්න.



මෙම සම්පත Cancer Council (පිළිකා කවුන්සිලය) SA සහ BreastScreen SA විසින් නිර්මාණය කරනු ලැබ ඇති අතර මුද්‍රණය සහ පරිවර්තනය සඳහා Country SA PHN විසින් අරමුදල් සපයා ඇත.

Cancer Council SA

නොමිලේ* සහ පිළිකා පිළිබඳ රහස්‍ය තොරතුරු සහ සහාය සඳහා, සඳුදා සිට සිකුරාදා දක්වා උදේ 9.00 සිට සවස 5.00 දක්වා:

- Cancer Council අමතන්න **13 11 20**
- **cancersa.org.au** වෙතින් මාර්ගගතව චැට් කරන්න
- ඊමේල් **askanurse@cancersa.org.au**

**131 450** ඔස්සේ භාෂණ පරිවර්තන සේවා නොමිලේ* ලබා ගත හැකිය.

*ප්‍රදේශීය ඇමතුමක ගාස්තුව

2025 පෙබරවාරි මස සමාලෝචනය කරන ලදී.

Sinhalese | සිංහල

Cancer Council SA

# පිළිකාව කලින් සොයා ගැනීම සඳහා පරීක්ෂණ

## ඔස්ට්‍රේලියාවේ පිළිකා පරීක්ෂා කිරීමේ වැඩසටහන් පිළිබඳ තොරතුරු



පිළිකා කල්තියා හඳුනා ගැනීම

තොරතුරු හා උපකාර

**13 11 20**

**cancersa.org.au**




# බඩවැලේ පිළිකා කල්තියා සොයා ගැනීම

ඔස්ට්‍රේලියාවේ ජාතික බඩවැල් පිළිකා පරීක්ෂා කිරීමේ වැඩසටහනක් ඇත. මෙම වැඩසටහන මගින් බොහෝ විට රෝග ලක්ෂණ ඔබට පැහැදිලිව පෙනෙන්නට පෙර, බඩවැල් පිළිකාවේ මුල් ලක්ෂණ සොයා ගැනීමට සරල පරීක්ෂණයක් භාවිතා කරයි. පරීක්ෂණය ඔබගේ නිවසට තැපෑලෙන් එවනු ලැබේ.

වයස අවුරුදු 45–74 අතර සියලුම ඔස්ට්‍රේලියානුවන් සෑම වසර දෙකකට වරක් බඩවැල් පිළිකා පරීක්ෂණය සිදු කළ යුතුය.

**වයස අවුරුදු 45–49:** ඔබේ පළමු බඩවැල් පිළිකා පරීක්ෂණය මාර්ගගතව ඇණවුම් කරන්න. ඊට පසු, ඔබට සෑම වසර දෙකකට වරක් ස්වයංක්‍රීයව නව පරීක්ෂණයක් ලැබෙනු ඇත.

**වයස අවුරුදු 50–74:** ඇණවුම් කිරීමකින් තොරව සෑම වසර දෙකකට වරක් ඔබට බඩවැල් පිළිකා පරීක්ෂණයක් ලැබෙනු ඇත.

**Cancer Council SA නිර්දේශ කරන්නේ:**

- ඔබගේ පරීක්ෂණ කට්ටලය තැපෑලෙන් ලැබුණු පසු එය සම්පූර්ණ කර ආපසු භාර දීම.
- ඔබට බඩවැල් පිළිකා රෝග ලක්ෂණ ඇත්නම් ඔබේ වෛද්‍යවරයා හමුවීම. රෝග ලක්ෂණ අතරට ඔබේ ගුද මාර්ගයෙන් ලේ ගැලීම, මලපහ කිරීමෙන් පසු වැසිකිළියේ හෝ වැසිකිළි කඩදාසි මත රුධිරය දැකීම, පැහැදිලි කළ නොහැකි මලබද්ධය හෝ පාචනය, හෝ පැහැදිලි කළ නොහැකි තෙහෙට්ටුව ඇතුළත් වේ.
- ඔබට බඩවැල් පිළිකා පිළිබඳ පවුලේ ඉතිහාසයක් තිබේ නම්, ඔබේ වෛද්‍යවරයා හමුවීම.

**QR කේතය ස්කෑන් කර:**

- **ඔබේ පළමු පරීක්ෂණ කට්ටලය හෝ ආදේශක පරීක්ෂණයක් ඇණවුම් කරන්න.**
- **ඔබේ භාෂාවෙන් තොරතුරු සොයා ගන්න.**



# පියයුරු පිළිකා කල්තියා සොයා ගැනීම

පියයුරු පිළිකාව කලින් සොයා ගැනීම සඳහා BreastScreen SA මගින් නොමිලේ මැමෝග්‍රෑම් පරීක්ෂණය ලබා දෙයි. මැමෝග්‍රෑම් එකක් යනු පියයුරු වල එක්ස් කිරණ පරීක්ෂණයකි.

මැමෝග්‍රෑම් පරීක්ෂණය වයස අවුරුදු 40 සහ ඊට වැඩි කාන්තාවන් සඳහා, විශේෂයෙන් වයස අවුරුදු 50-74 අතර කාන්තාවන්, සඳහා වේ.

නොමිලේ සිදු කරන ඔබගේ මැමෝග්‍රෑම් පරීක්ෂණය වෙන්කරවා ගැනීමට QR කේතය ස්කෑන් කරන්න, නැතහොත් 13 20 50 ඔස්සේ BreastScreen SA අමතන්න. ඔබගේ හමුවීම සඳහා ඔවුන්ට කිසිදු වියදමකින් තොරව කාන්තා භාෂණ පරිවර්තකයෙකු වෙන්කරවා ගත හැකිය.

සියලුම කාර්ය මණ්ඩලය කාන්තාවන් වේ. මෙය සිදු කිරීමට ඔබේ වෛද්‍යවරයාගෙන් යොමු කිරීමක් අවශ්‍ය නොවේ.

**Cancer Council SA සහ BreastScreen SA නිර්දේශ කරන්නේ:**


- සෑම වසර දෙකකට වරක් නොමිලේ මැමෝග්‍රෑම් පරීක්ෂණයක් සිදු කිරීම.
- ඔබේ පියයුරු වල සාමාන්‍ය පෙනුම සහ හැඟීම දැන ගැනීමෙන් ඔබට ඕනෑම වෙනසක් දැකගත හැකිය. වෙනස්කම් අතරට ගැටිත්තක්, තන පුඩුවෙන් ශ්‍රාවයක් පිටවීමක්, හෝ ඔබට සාමාන්‍ය නොවන වෙනත් වෙනසක් ඇතුළත් වේ.
- මැමෝග්‍රෑම් පරීක්ෂණයක් ඔබට සුදුසු නොවන බැවින්, යම් වෙනසක් දුටුවහොත් ඔබේ වෛද්‍යවරයා හමුවන්න.

**breastscreen.sa.gov.au වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.**

- මැමෝග්‍රෑම් එකක් කර ගැනීම පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා.
- ඔබේ භාෂාවෙන් තොරතුරු ලබා ගැනීම සඳහා.

**QR කේතය ස්කෑන් කර:**

- **මැමෝග්‍රෑම් පරීක්ෂණය සඳහා ඔබගේ හමුවීම අන්තර්ජාලය හරහා වෙන්කරවා ගන්න.**



# ගැබ්ගෙල පිළිකා කල්තියා සොයා ගැනීම

මානව පැපිලෝමා වයිරසයට (HPV) එරෙහිව ප්‍රතිශක්තිකරණය ලබා ගැනීමෙන් සහ නිතිපතා ගැබ්ගෙල පරීක්ෂා කිරීමේ පරීක්ෂණයක් සිදු කිරීමෙන් ගැබ්ගෙල පිළිකා නැවැත්විය හැකිය.

වයස අවුරුදු 25-74 අතර ගැබ්ගෙලක් ඇති කාන්තාවන් සහ පුද්ගලයින් සෑම වසර පහකට වරක් වෛද්‍ය සායනයක දී පරීක්ෂණය සිදු කළ යුතුය. ඔබේ පරීක්ෂණය ඔබ විසින්ම සිදු කිරීම තෝරා ගත හැකිය (ස්වයං-එකතු කිරීම), නැතහොත් වෛද්‍යවරයෙකුට හෝ හෙදියකට ඔබ වෙනුවෙන් පරීක්ෂණය කළ හැකිය.

**Cancer Council SA නිර්දේශ කරන්නේ:**

- HPV වයිරසයට එරෙහිව ප්‍රතිශක්තිකරණය ලබා ගැනීම. වයස අවුරුදු 12-25 අතර පුද්ගලයින් සඳහා එන්නත නොමිලේ ලැබෙනු ඇත. ෆාමසියකින් හෝ වෛද්‍ය සායනයකින් එන්නත ලබා ගන්න. 7 වැනි වසරේ දරුවන්ට පාසලේදී එන්නත පිරිනමනු ඇත.
- වයස අවුරුදු 25 සිට ගැබ්ගෙල පරීක්ෂා කිරීමේ පරීක්ෂණයක් කර ගැනීම.
- ඔබ හමුවීමක් සිදු කරන විට, ඔබට භාෂණ පරිවර්තකයෙකු අවශ්‍ය නම්, ඒ සඳහා ඉල්ලා සිටින්න. ඔබ කැමති නම්, ඔබට කාන්තා වෛද්‍යවරියක හෝ හෙදියක ඉල්ලා සිටිය හැකිය.
- ගැබ්ගෙල පිළිකා රෝග ලක්ෂණ ඇත්නම් ඔබේ වෛද්‍යවරයා හමු වන්න. රෝග ලක්ෂණ අතරට ඔසප් වීම අතරතුර රුධිර වහනය හෝ ලිංගිකව එක්වීමේදී වේදනාව ඇතිවීම ඇතුළත් වේ.

**ස්වයං එකතු කිරීමේ විකල්පය ඇතුළුව ගැබ්ගෙල පරීක්ෂා කිරීම පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා QR කේතය ස්කෑන් කරන්න.**